# විදේශ කටයුතු, විදේශ රැකියාසහ සංචාරක අමාත්‍ය කාර්යාලය

**வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர் அலுவலகம்**

**OFFICE OF MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM**


| මගේ අංකය<br>எனது இல<br>**My No** | MFA/M/PR/25/28 | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** | | දිනය<br>திகதி<br>**Date** | 2025.05.06 |
|---|---|---|---|---|---|

## මාධ්‍ය නිවේදනය

මියන්මාර සයිබර් අපරාධ කඳවුරුවල බලෙන් රඳවාගෙන සිටි ඉතිරි ශ්‍රී ලාංකියන් 15 දෙනා (මෙතෙක් වාතර්ා වූ) අද (06) මුදවාගනු ලැබුවා. ඒ තායිලන්ත රජය සම්බන්ධීකරණයෙන් මෙරට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය හා තායිලන්තයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කළ මෙහෙයුමකිනි.

15 දෙනාගෙන් යුතු ශ්‍රී ලාංකිකයන් පිරිස අද පෙරවරුවේ මියන්මාර තායිලන්ත දේශසීමාවේ මියාවඩි ප්‍රදේශයේ මීසෝට්හි දී තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති විජයන්ති එදිරිසිංහ මහත්මිය වෙත තායිලන්ත බලධාරීන් විසින් භාර දෙනු ලැබුවා. ශ්‍රී ලාංකිකයන් භාරගැනීමේ අවස්ථාවට තායිලන්ත තානාපති කාර්යාලයේ නිලධාරීන් පිරිසක් ද එක්ව සිටියා.

මෙම පිරිස මුදවාගනු ලැබුවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතා තායිලන්ත විදේශ කටයුතු අමාත්‍ය මරිස් සන්ගම්පොන්ස්ගා (Maris Sangiampongsa) මහතා සහ මියන්මාර විදේශ කටයුතු අමාත්‍ය යූ තාන් ස්වේ (U Than Swe) මහතා සමඟ වරින් වර කළ දුරකථන සංවාදවල ප්‍රතිපලයක් අනුවයි.

සයිබර් අපරාධ කඳවුරුවල සිර වී සිටි ශ්‍රී ලාංකියන් මුදවාගැනීමේ ක්‍රියාවලියට රාජතාන්ත්‍රිකව මැදිහත් වූ තායිලන්ත තානාපති කාර්යාලය, ප්‍රවාහන පහසුකම් සැලසූ සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර කාර්යාලය, සෙසු සුබසාධන පහසුකම් සැලසූ රාජ්‍ය නොවන ආයතන සහ තායිලන්ත හා මියන්මාර රජයන්ගේ කාර්යභාරය අමාත්‍ය විජිත හේරත් මහතා ඇගයීමට ලක් කළේ ය.

මෙම අවස්ථාවට අදාළ ඡායාරූප මේ සමඟ අමුණා ඇත.

මීට පෙර ඉකුත් මාර්තු මස 18 වන දින මියන්මාර සයිබර් අපරාධ කඳවුරුවල සිරවී සිටි ශ්‍රී ලාංකිකයන් 14ක් සහ 2024 දෙසැම්බර් 17 වන දින ශ්‍රී ලාංකිකයන් 27ක් මෙරටට ගෙන්වා ගනු ලැබුවා.


**සකීෆ් සාම්**
මාධ්‍ය ලේකම්
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය කායර්ාලය
media.secretary@mfa.gov.lk